දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/9/AT/Acc/2025 - I
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.03. 13

**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

**<u>2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය</u>**

ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියලු ස්ථාන මාරු 2026.04.02 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. 2026 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් එකී නිශ්චිත දිනවල සිට ද අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක විය යුතු වේ. ඒ අනුව, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුම්වත් කරන ලෙස මෙයින් දන්වමි.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙන ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05. 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257(V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07. තවද, 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යාංශ වෙනස්වීම් හේතුවෙන් යම් නිලධරයකු ස්ථාන මාරු විය යුතු සේවා ස්ථානය පිළිබඳව ගැටලු සහගත තත්වයක් පවතින අවස්ථාවක දී, අදාළ නිලධාරියාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධරයා සේවයේ යෙදී සිටින ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

08. එසේම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන්
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ - 2026

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| ස්ථාන මාරු චක්‍ර අංක 01 | | | | | |
| 1 | කේ.එස්.එස්. වීරවර්ධන මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | කෘෂිකර්ම අමාත්‍යාංශය - දකුණු පළාත | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව අවලංගු කර ඇත. |
| 2 | එච්.පී.ඊ.එම්. තිසේරා මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය | කෘෂිකර්ම අමාත්‍යාංශය - දකුණු පළාත | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව අවලංගු කර ඇත. |
| ස්ථාන මාරු චක්‍ර අංක 06 | | | | | |
| 3 | වී.සී. විජේවර්ධන මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | බන්ධනාගාර මූලස්ථානය | අභියාචනය නිශ්ප්‍රභ කර ඇත. |